# ශ්‍රී ලංකාවේ බෞද්ධාගමික ප්‍රගමනය උදෙසා ගාලු වරායෙන් ඉටුවූ සේවාව

රුවන් දිලින්ත වින්ඩ්සර්[1]

අතීතයේ සිට විදේශිකයන් අතර ප්‍රචලිත ගාලු වරාය 19 වැනි සියවසේ හා 20 වැනි සියවසේ මුල් භාගයේ දී ශ්‍රී ලංකාවේ බෞද්ධාගමික ප්‍රගමනය උදෙසා දක්වන ලද දායකත්වය කුමක් ද යන්න මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මෙහිදී දත්ත විශ්ලේෂණ කරන ලදී. මෙම කාළ පරාසය තුළ ගාලු වරාය මගින් ආගමන හා විගමන වූ කණ්ඩායම් කිහිපයක් මෙහි දී හඳුනාගත හැකි විය. ලාංකික ගිහි හා පැවිදි පිරිස්, සියම් දූත පිරිස්, බුරුම දූත පිරිස් හා යුරෝපීය පිරිස් එම කණ්ඩායම් වේ. 19 වැනි සියවස වන විට ගාලු වරායා අත්කරගෙන තිබූ ප්‍රසිද්ධිය හේතු කරගෙන මෙම ආගමනයන් හා විගමනයන් පසුවෙන්ම මෙම වරාය හරහා සිදු වූ බව පෙනෙයි. එම නිසා ගාලු නගරය ආසන්න ප්‍රදේශ (මීණුවන්ගොඩ, මාගාල්ල, දොඩන්දූව ආදී) බෞද්ධාගමික කටයුතු සඳහා සක්‍රීයව දායක වූ ප්‍රදේශ විය. අඹගහපිටියේ ඤාණවිමලතිස්ස නාහිමි, බෝගහපිටියේ ධම්මජෝති නාහිමි, අඹගහවත්තේ ඉන්ද්‍රසභවර ඤාණසාමී නාහිමි, පුවක්දණ්ඩාවේ පඤ්ඤානන්ද නාහිමි ආදී පැවිදි පිරිස් බුරුමය බලා පිටත් වූයේ ගාලු වරායෙන් වන අතර අඹගහපිටියේ, බෝගහපිටියේ සහ අඹගහවත්තේ යන හිමිවරු මෙරටට පැමිණීමෙන් නව භික්ෂු නිකායන් ආරම්භ වීම සිදුවිය. බුලත්ගම ධම්මාලංකාර හිමි තායිලන්ත රජමාලිගාවේ වස් විසීම සඳහා පිටත් වන්නේ ද නැවත චූලාලංකාර රජු පිදූ ධාතූන් වහන්සේලා හා පූජා භාණ්ඩ රැගෙන මෙරටට පැමිණෙන්නේ ද මෙම වරායෙනි. 1897 දී සියම් චූලාලංකාර රජු මහාචක්‍රී නෞකාවෙන් ගාලු වරායට පැමිණෙන්නේ සියම්-ලංකා මිත්‍රත්වයේ සන්ධිස්ථානයක් සනිටුහන් කරමිනි. මෙන්ඩුන් රජු විසින් මාතර ධම්මාරාම හිමියන්ට එවන ලද පූජාවන් රැගෙන ධම්මසිද්ධිරාජා, සූරසීහ නම් ඇමතිවරු ද, දළදා වැදීමට පැමිණි "සින්කුන්, ල්හේඋප්, නේමයු, මෙල්හ, ජෙයාසු "ආදී බුරුම දූත පිරිස් ගාලු වරායෙන් මෙරටට පැමිණීම මෙන්ම බුරුම ගිහි පැවිදි පිරිස් සමග ලාංකික පිරිස් ලිපි ගනුදෙනු කිරීම නිසා පහතරට විශේෂ බෞද්ධාගමික ප්‍රබෝධයක් ඇති විය. 1880 දී ඕල්කට්තුමන්ගේ ලංකාගමනයත් සමග පරමවිඥානාර්ථ සමිතියේ නොමඳ සහයෝගය මෙම බෞද්ධාගමික ප්‍රගමනයට ලැබුනු අතර ඒ ඔස්සේ පාලි උගතකු වන එෆ්. එල්. වුඩ්වඩ් මහතා මෙරට පැමිණ ත්‍රිපිටකය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම ද ආරම්භ විය. මේ ආකාරයෙන් බලන කළ ගාලු වරාය ගමනාගමන කේන්ද්‍රිය ස්ථානයක් වීමෙන් සමකාලීන බෞද්ධාගමික දියුණුවට ඉටු වූ සේවය ඉමහත් බව පෙනෙයි.

**ප්‍රමුඛ පද** : ගාලු වරාය, බුලත්ගම ධම්මාලංකාර හිමි, ඕල්කට්තුමා, බෞද්ධාගමික ප්‍රබෝධය

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.ruwanwind@gmail.com